ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL' S DEPARTMENT

ෆැක්ස් / பெக்ஸ் / Fax } 2684051

නො.07,ග්‍රෙගරි මාවත, කොළඹ 07.
இல 7 ,கிரகறிஸ் மாவத்தை கொழும்பு 07
No 07 Gregory's Avenue Colombo 07

ඊමේල් / ஈ - மெயில் / E-mail } Landcom@sltnet.lk


මගේ අංකය / எனது இல / MY NO } 3/සං/4/දේ.ආ.නි.　　ඔබේ අංකය / உமது இல / YOUR NO }　　දිනය / திகதி / DATE } 2007.11.07

චක්‍රලේඛ අංකය : 2007/05

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**' අපි වවමු - රට නගමු '**

**දේශීය ආහාර නිෂ්පාදන දිරි ගැන්වීමේ ජාතික මෙහෙයුම 2007 - 2010**

**ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බෙදාදී බලපත්‍ර මත ඇති ඉඩම් සංවර්ධනය කිරීම**

---

'අපි වවමු - රට නගමු ' දේශීය ආහාර නිෂ්පාදන දිරි ගැන්වීමේ ජාතික මෙහෙයුමට අදාළව ජනාධිපති ලේකම් විසින් 2007.10.02 දින එවා ඇති උපදෙස් ලිපියට ඔබගේ කාරුණික අවධානය යොමු කරමි.

02. දේශීය ආහාර නිෂ්පාදන දිරි ගැන්වීමේ කටයුතු වේගවත් කිරීම සඳහා ශ්‍රී ලංකාව තුල ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බෙදාදී ඇති ඉඩම්, හැකිතාක් දුරට යොදා ගැනීමේ අවශ්‍යතාව පිළිබඳව ගරු ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජීවන් කුමාරණතුංග මැතිතුමාගේ අවධානය යොමුවී ඇත. දැනටමත් ශ්‍රී ලංකාව පුරා බලපත්‍රයක් පමණක් නිකුත් කර ඇති ඉඩම් කැබලි 140000 කට ආසන්න ප්‍රමාණයක් ඇති අතර එම ඉඩම් සංවර්ධනය කරන තුරු දීමනාපත්‍ර නිකුත් කිරීමේ කටයුතු කළ නොහැකි බැවින් මෙම ඉඩම් ඉහත සඳහන් වැඩසටහනට සම්බන්ධ කරගෙන දේශීය ආහාර නිෂ්පාදන වැඩසටහන දිරි ගැන්වීමට යොදා ගත යුතුව ඇත. මෙයින් ඇතැම් ඉඩම් නේවාසික කටයුතු සඳහා ලබාදී ඇති බැවින් ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛයේ 4 වන ඡේදයේ 1 යටතේ දක්වා ඇති ගෙවතු සංවර්ධන වැඩසටහනට යොමු කර ගැනීම අවශ්‍යය. කෘෂිකාර්මික කටයුතු සඳහා බෙදාදී ඇති සියළු ඉඩම් අත්‍යාවශ්‍ය ආහාර භෝග නිෂ්පාදනයට යෙදවීමටත් කටයුතු කළ යුතුව ඇත. එබැවින් බලපත්‍රලාභී ගොවි ජනතාව ඉහත අරමුණ කරා මෙහෙයවීමට ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය යොදවා ගැනීමටත්, පළාත් ඉඩම් කොමසාරිස්ගේ උපදෙස් ලබා ගෙන එම ආයතනවල සියළුම ක්ෂේත්‍ර නිලධාරීන් යොදවා ගැනීමටත් කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.


. . . . . . . . . . 02).

03. දැනටමත් සියළුම ඉඩම් නිලධාරීන්ට , ජනපද නිලධාරීන්ට හා ක්ෂේත්‍ර උපදේශකවරුන්ට බලපත්‍ර ලබාදුන් ඉඩම් කැබලි 15 ක් එක් මාසයක් තුළ අධීක්ෂණය කිරීමේ කටයුතු භාරදී ඇත. එහිදී සංවර්ධනය නොකරන ඉඩම් ඇත්නම් ඒ සම්බන්ධව ඉඩම් සංවර්ධන ආඥා පනතේ 106 වගන්තිය යටතේ නියෝග ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වාර්තා ඔබට සපයන ලෙස උපදෙස් දී ඇත. එකී වැඩපිළිවෙල දේශීය ආහාර නිෂ්පාදන දිරි ගැන්වීමේ ජාතික මෙහෙයුම ශක්තිමත් කිරීම සඳහා තවදුරටත් යොදා ගත හැකිය. මේ අනුව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව හා පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවල සියළුම ක්ෂේත්‍ර නිලධාරීන් ඉලක්ක ගත වැඩසටහනක් යටතේ ඉහත කී ඉඩම් මාසිකව පරීක්ෂා කිරීමටත් එසේ පරීක්ෂා කොට ලබාදෙන ඉ.කො.59 ආකෘතිය අනුව සංවර්ධනය කර නොමැති ඉඩම් සඳහා ඉඩම් සංවර්ධන ආඥා පනතේ 106 වගන්තිය යටතේ දැන්වීම් නිකුත් කිරීමටත් කටයුතු කරන ලෙස මෙයින් දන්වා සිටිමි. මෙම වැඩසටහනේ ප්‍රගතිය සම්බන්ධව මාසික වාර්තාවක් පළාත් ඉඩම් කොමසාරිස් වෙත යැවීමට පියවර ගන්නා ලෙසද ප්‍රාදේශීය මෙහෙයුම් කමිටුවේදී (කෘෂිකර්ම අමාත්‍යාංශය නිකුත් කරන ලද අත්පොතේ 8.4 ඡේදය ) සාකච්ඡාවට ගැනීමටද කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

එස්.ඩී.ඒ.බී.බොරලැස්ස,
ඉඩම් කොමසාරිස් ජනරාල්.

පිටපත්: 01. ගරු ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය.
02. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය.
03. ලේකම්, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය.
} දැන ගැනීම සඳහා.
04. ලේකම්, කෘෂිකර්ම හා ගොවිජන සේවා අමාත්‍යාංශය.
05. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් - මෙම වැඩසහන දිස්ත්‍රික් මෙහෙයුම් කමිටුවේදී සාකච්ඡා කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලමි.
06. සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන් - මෙම වැඩසටහන පළාත් මට්ටමින් සම්බන්ධීකරණය කිරීමටත් අදාළ මාසික ප්‍රගති වාර්තා මා වෙත ලබාදීමටත් කරුණාකර කටයුතු කරන මෙන් ඉල්ලමි.
07. සියළුම නියෝජ්‍ය/ සහකාර ඉඩම් කොමසාරිස්වරුන් (අන්තර් පළාත් ) - ඉහත උපදෙස් අන්තර් පළාත් ගොවි ජනපද වලට අදාල වන අවස්ථා වලදී ක්‍රියාත්මක කිරීමටත් ඒ සම්බන්ධව මාසික ප්‍රගතිය මා වෙත වාර්තා කිරීමටත් කරුණාකර කටයුතු කරන්න.